දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 17/2015

මගේ අංකය - 13/අ/වැ/ඇස්ත/2015
අත්තිකාරම් ගිණුම් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2015/06/

බන්ධනාගාර අධිකාරී,
සහකාර බන්ධනාගාර අධිකාරී
.............................................

## අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම - 2016

2016 වර්ෂය සඳහා කාර්මික හා කෘෂිකාර්මික කටයුතු සඳහා වූ ආදායම් හා වියදම් ඇස්තමේන්තු භාණ්ඩාගාරය හා අමාත්‍යාංශය වෙත වාර්තා කල යුතුය.ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීම සිදුකල යුතු බැවින් කාර්මික හා කෘෂිකාර්මික කටයුතු වල නිරත සියළුම බන්ධනාගාර ආයතන විසින් නිසි අයවැය ඇස්තමේන්තුවක් සකස් කර 2015/07/30 වන දිනට ප්‍රථම බන්ධනාගාර මූලස්ථානය වෙත ලැබීමට සැලස්විය යුතුය.මෙහි දී ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික අයවැය ඇස්තමේන්තු ඔබට ලබා දිය හැකි ඇස්තමේන්තුවක් වීම වැදගත් වේ.2016 වර්ෂය තුළ ඔබ ආයතනයට ලඟා විය හැකි ඉලක්ක වලට වඩා වැඩි වියදම් ඇස්තමේන්තු කිරිම මගින් ඇතිවිය හැකි ප්‍රතිපාදන ඉතිරිවීම් ඇති නොවීමට ඇස්තමේන්තු සකස් කර යුතුය. එම අධි ඇස්තමේන්තු භාණ්ඩාගාරයේ හා විගණකාධිපතිගේ විගණන විමසුමට ලක්විය හැකිය. අයවැය මගින් අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන සීමාව ඉක්මවා කටයුතු කිරිම පසුගිය වසර කීපය තුල දක්නට ලැබුණි. කැබිනට් අනුමැතිය ලබා ගැනිමේ දී ද යම් යම් දුෂ්කරතා වලට පවා මුහුණ දීමට සිදුවූ බැවින් 2016 වසර සඳහා ඔබ ආයතනය විසින් ප්‍රශස්ථ අයවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරිමට කටයුතු කරන දෙස දැනුම් දෙමි.
ඔබ විසින් මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව ඇස්තමේන්තු ඉදිරිපත් කල යුතු අතර 2016 මුළු වියදම 2015 වර්ෂයට ඔබට වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා 10% කට වැඩි ප්‍රතිශතයකින් වැඩිවන්නේ නම්,

i. එසේ වැඩිවීමට හේතු.(උදා -ලෙස වගා අස්වැන්න වැඩිවේ යැයි අපේක්ෂා කරන්නේ නම් වගාබිම් වැඩිවුණි ද? එසේ අස්වැන්න වැඩිකිරිමට ගත් කියාමාර්ග)
ii. වැඩි වූ නිෂ්පාදන අලෙවි කරන්නේ කා හට ද ? ඇනවුම් ලැබී තිබේ ද?
iii. අලෙවි කල නිෂ්පාදන වටිනාකම ආපසු අය කර ගැනිමට ගන්නා ක්‍රියාමාර්ග මොනවා ද?
iv.

ඉහත කරුණු ඇතුලත් ඇස්තමේන්තු වාර්තාව අදාළ දිනයට පෙර බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත /නිපුණතා) මඟින් අත්තිකාරම් ගිණුම් අංශය වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.මේ පිළිබඳ වැඩිදුරට කරුණු බන්ධනාගාර කොමසාරිස්(මුදල්) හෝ සහකාර කොමසාරිස් (මුදල්)අත්තිකාරම් ගිණුම් වෙතින් ලබා ගැනිමට කටයුතු කරන්න.

.....................................
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

# කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් කටයුතු
## ආදායම් ඇස්තමේන්තුව - 2016

ආයතනය -

ආදායම් -

| වැඩ අංශය | 2013 මුළු ආදායම් | 2014 මුළු ආදායම් | 2015 | | 2016 | | මුළු ආදායම |
|---|---|---|---|---|---|---|---|
| | | | පළමු කාර්තුවේ ආදායම් | දෙවන කාර්තුවේ ආදායම් | පළමු හා දෙවන කාර්තුව අපේක්ෂිත ආදායම් | තුන්වන හා හතරවන කාර්තුවේ අපේක්ෂිත ආදායම් | |
| | | | | | | | |

# කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් කටයුතු
# වියදම් ඇස්තමේන්තුව - 2016

ආයතනය -

වියදම් -

| වැඩ අංශය | 2013 මුළු වියදම් | 2014 මුළු වියදම් | 2015 | | 2016 | | 2016 මුළු වියදම් | 2015ට වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය | 2016 අපේක්ෂිත වියදම 2015ට වෙන්කර ඇති ප්‍රතිපාදන වලට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පළමු කාර්තුවේ මුළු වියදම | දෙවන කාර්තුවේ මුළු වියදම | පළමු හා දෙවන කාර්තුව අපේක්ෂිත වියදම් | තුන්වන හා හතරවන කාර්තුවේ අපේක්ෂිත වියදම | | | |
| | | | | | | | | | |